# වනාන්තර සහ වනාන්තර ආශ්‍රිත ක්‍රියා පිළිබඳ පාරම්පරික දැනුම

හැඳින්වීම

"වනාන්තර" යන වචනය ඇසීමෙන් අප තුළ එක එල්ලේම වැරදි අදහසක් ඇතිවිය හැකිය. එහිදී "රුස්ස ගස් සහිත කැලෑවක්" යන අදහස පමණක් නිතැතින්ම ඇති වෙයි. එබැවින් "වනාන්තර" යන්නට පැහැදිලි අර්ථ කතනයන් දී ඒ තුළ පිහිටා සිටිමින්, "වනාන්තර සහ වනාන්තර ආශ්‍රිත ක්‍රියා පිළිබඳ පාරම්පරික දැනුම" විග්‍රහ කර දැක්වීම වඩාත් උචිත බැව් පෙනේ.

මිනිසා ස්ථිරවම පදිංචි නැති ගස්වැල් ආදිය ඇති කිසියම් කැලයක් වෙතොත් එය "වනාන්තරය" යන්නෙන් මෙහිදී අදහස් කරනු ලැබේ. ඒත් සමගම, මිනිසාගේ වනාන්තර ආශ්‍රිත ක්‍රියා මෙන්ම ගස්වැල් වලත් සියලු ජීවින්ගේත් පැවැත්ම එකිනෙකට සම්බන්ධ බැව් ද මෙනෙහි කළ යුතුව ඇත. මේ අන්තර් සබඳියා මෙහි පහත සටහනින් දැක්වේ"




මෙහිදී මෙම පරිසර පද්ධතියේ පවත්නා අන්තර් සම්බන්ධතාවය ගැන පැහැදිලි කිරීමක්ද අවශ්‍යයි. මිනිසාට ජීවින් අවශ්‍යය. සමහර ජීවින් මිනිසාට ආහාර සපයන්නෝය. මිනිසා සඳහා බර ඇද දෙන්නෝය. මිනිසාට ආරක්ෂාව සපයන්නෝය. මිනිසා ජීවින්ටද ආරක්ෂාව සපයන්නෙකි. ඔවුනට ආහාර සපයන්නෙකි. ඔවුන්ගේ ව්‍යාප්තියටද ආධාර කරන්නෙකි. ජීවින් ද ගහකොළ ව්‍යාප්ත කරන්නෝය. ගස්වැල් අතර හැසිරෙමින් ඒවායේ සුන්දරත්වය වැඩි කරන්නෝය. ගහකොළ සත්ත්වයින්ට ආරක්ෂාව රැකවරණ සපයයි. ආහාර සපයයි. සෙවන සපයයි. ගහකොළ මිනිසාට ආහාර, දැව දඬු සපයන අතර මිනිසාට හිතකර දේශගුණික සහ කාලගුණික තත්ත්වයන් ඇති කර දෙයි. මිනිසාද ගහකොළ ව්‍යාප්ත කිරීමටත්, වර්ධනය කිරීමටත් උත්සුක වන්නෙකි.

ඉහත දැක්වූයේ මේ අන්තර් සම්බන්ධතා ක්‍රියාවලියේ යහපත් පැති සමහරක් පමණි. එහි අයහපත් පැතිද එමටය. මිනිසා ගහකොළ විනාශ කිරීම හේතු කොට ගෙන ගහකොළට මෙන්ම ජීවින්ගේ පැවැත්මටද හානි කිරීම එක් නිදර්ශනයකි. කොතෙක් දුරට මිනිසා මෙම යහපත් සහ අයහපත් පැවැතුම් ගැන පාරම්පරිකව දැනුමක් ලබා සිටියේද යනාදිය ගැන මෙතැන් සිට විමර්ශනය කෙරේ.

## මෙරට වනාන්තරවල පැවැත්මට තර්ජන

විසිවැනි සියවසේ මැද භාගය වන විට ශ්‍රී ලංකා භූමියේ 40% ක් ගස්කොළන් වලින් ආවරණය වී පැවතියේය. පරිසර විද්‍යාඥයන්ගේත් කාලගුණ සහ දේශගුණ විද්‍යාඥයන්ගේත් සම්මතය වනුයේ රටක භූමියෙන් 30% ක් පමණ වත් ගස් කොළන් වලින් ආවරණය වූ භූමිය 20% කටත් අඩු වී ඇත. මෙය මිනිසාගේ පැවැත්මට විශාල තර්ජනයකි. ලංකාව

ගහකොළොන් ආවරණය වී පැවතීම තවත් අඩු වී යාමට ඉඩ නොදී පවත්වා ගැනීමට විද්‍යානුසාරයෙන් යෙදිය හැකි පිළියම් බොහෝය. එමෙන්ම ගහකොළ සහ ජීවීන් ආශ්‍රිත පැවැත්වීමට පරිසරය සමග අහිතකාරී ලෙස සිදුවන සහ සිදු කරන ගැටීම් අවම කර ගැනීමේදී මිනිසා පාරම්පරිකව ලත් දැනුමෙන් ගත හැකි පාඩම් බොහෝය.

## වනාන්තර ආරක්ෂා කිරීමේ පාරම්පරික උපක්‍රම

මිනිසා විසින් අහිතකර ලෙස ගහකොළට හානිකිරීම වලක්වාලනු වස් පැරැන්නෝ වනය දේවතාවුන් අධිගෘහිත කලාපයක් ලෙස මිනිසුන්ට සිතීමට සලසා තිබිණි. ලංකාව තිස්තුන් කෝටියක් දෙවියන් බලන රටක් වශයෙනුත් ඉන් බොහෝ අය රුක් දෙවියන් වශයෙනුත් සලකා ඇත. එබැවින් ගස්වලට මිනිසා විසින් කල හැකි හානි අවම කරලීමට ක්‍රමෝපායන් යොදා තිබිණි. මේ නිසයි සමහර උදවිය ගසකට නැගීමට හෝ බෙහෙත් ඖෂධයක් වශයෙන් ගසකින් පොත්තක් හෝ කොළ කැඩීමට කලින් ගසට නමස්කාර කර සිටිනුයේ. කිසියම් කාර්යයක් සඳහා දඩයම් කිරීමට, එල නෙලීම, බෙහෙත් ඖෂධ ලබා ගැනීමට, දව දඬු කපා ගැනීමට කැලෑවට ඇතුළු වීමේදී අතු කඩා ගසක එල්ලා, වනයට අධිගෘහිත දෙවි දේවතාවුන්ගේ අවසරය සහ ආරක්ෂාව ඉල්ලා සිටියේ වනාන්තරයට (කැළයට) ඇති ගෞරවය නිසාත් එහිදී කැලයට කිසියම් හානියක් වෙතොත් එය අවමව කිරීමේ අභිලාෂයෙනුත් යුතුවය.

සමහර ගස් කොළන් ආරක්ෂා කරවීමට සම්මත රීති අනුගමනය කර තිබිණි. බුදු රජාණන් වහන්සේගේ බුද්ධත්වය ලබා ගැනීම බෝගසක් යට සිදු වූයෙන් බෞද්ධයන්ට බෝ ගස් කැපීම අකපැය. ඉතා හෙමින් වැවෙන නා ගස් සහ මී ගස් කැපිය හැකි වූයේ පන්සල්වල හා දේවාලවල වහලවල් සෑදීමට පමණි. මෙම ගොඩනැගිලි ඉතා කලාතුරකින් සිදුකල දෑ බැවින් ඒවා කැපීමද සිදුකලේ ඉතාමත් කලාතුරකිනි. මිනිසුන්ගේ එදිනෙදා වාසස්ථාන තැනීමට ඉතා සෙමින් වැවෙන එම ගස්වලින් දුවදඬු කපාගැනීම අකැපවම පැවතිණ.

එල නෙළාගැනීම සඳහා ඇතැම් ගස් මුලින්ම කැපීම හෝ ඒවායේ විශාල කඳන් කැපීම අසම්මත ක්‍රියාවක්ව පැවතිණ. එසේ විශාල කඳන් කපා එල නෙලූ විට වසර ගණනාවකට සමහර ගස් එල නොදරති. මේ නිසා මොර කඩා ගැනීමට කැළයට යන්නෝ කෙතරම් අසීරු වුවත් මොර ගස් මුදුන්වලට නැග හැකි තරම් කුඩා - අතු රිකිළි කපා බිමට පතිත කරවා මොර කැඩීමේ සම්ප්‍රදායක් පවත්වා ගෙන ගොස් ඇත්තේ.

## හේන් ගොවිතැන් ආශ්‍රිත පාරම්පරික දැනුම

ජන සංඛ්‍යාව වැඩි වී යාමත් පදිංචිය සඳහා මෙන්ම ස්ථිර ගොඩ සහ මඩ ගොවිතැන් කිරීම සඳහාත් කැලෑ ඉඩම් වේගයෙන් අස්වැද්දීම සහ ගෙවල් දොරවල් තනාගැනීමේ ගෙවතු සඳහා යොදා ගැනීමත් නිසා අද හේන් ගොවිතැන් කෙරෙන්නේ ඉතාමත් කලාතුරකිනි.

ඒ කෙසේ වෙතත් විශේෂයෙන්ම විසිවැනි සියවසේ මුල් භාගයේදී බහුලවත් එම සියවසේ මැද භාගයේදී තරමක් අඩු වශයෙනුත් හේන් ගොවිතැන් කිරීම පැවතිණ. එය විශේෂයෙන්ම කෙරුණේ වියලි සහ අන්තර් දේශගුණ කලාපවලය. හේන් ගොවිතැන සඳහා කැලෑ එළි පෙහෙලි කිරීම ආශ්‍රිතව පාරම්පරිකව උකහාගෙන වැඩෙහි යෙදීමේ ඥාන සම්භාරයක්ම පැවතිණ.

# හේන් බිම් තෝරාගැනීම පිළිබඳ පාරම්පරික ඥානය

බොහෝවිට හේන් ගොවියා මුලින්ම කලේ ඉදිරි කන්නයේදී වගාකිරීම සඳහා බෝගයක් හෝ බෝග නිගමනය කිරීමයි. එනම්, ඊළඟ කන්නයේදී වගා කිරීමට බලාපොරොත්තු වනුයේ ගොඩ වී හේනක්ද, මඩ තාවල්ලක්ද, කුරක්කන් හේනක්ද, තල හේනක්ද යන්නයි. ඊළඟට ඔහු කලේ තමන් තෝරාගත් බෝගයට සරිලන පසක් ඇති කැලෑ ඉඩමක් තෝරා ගැනීමයි. එහිදී පසෙහි සංයුතිය, ජලාශ්‍රිත බව මෙන්ම ඇතැම් ගස් වර්ගවල සුලබත්වය, තමා කැමති බෝගය වැවීම සඳහා උචිත කැලෑ පෙදෙසක් තෝරා ගැනීමට උපයෝගී කර ගන්නේ තමා ලබා ඇති පාරම්පරික ඥානය මෙහෙයවා ගනිමින්ය. දෙමට සහ ඉලිපත්තා බහුල පෙදෙස් ගොඩ වී හේන් ගොවිතැනටත්, සේරු, බොරදමන සහ වීර ගස් බහුල පෙදෙස් කුරක්කන් / අබ හේන්වලටත් උචිත බැව් හේන් ගොවියෝ පාරම්පරිකවම දැන සිටියෝය.

රතුපස හෝ ගුරු පැහැති රතු පස තෝරාගන්නේ අබ සහ කුරක්කන් වැපිරීමටය. සියුම් මෙන්ම තෙතමනය වැඩිකලක් රඳවා ගත හැකි ඇලුවියල් පස ඇති කැලෑ බිම් යොදාගන්නේ ගොඩ වී හේන් වැපිරීමටය. වැව් ඉස්මතුවල තාවකාලිකව මඩ පසෙහි දියලු භාවය පවතින ස්ථාන එසේත් නැත්නම් මිටියාවත් වල කුඩා ඔයවල් ආදී දියපාරවල් දෙපස ඇති දියලු පස් බිම් යොදා ගන්නේ මඩතාවුළු වී හේන් ගොවිතැනටය. ඇටෝරා (රළු වැලි සහිත එහෙත් කළු පැහැති පස) සොයා ගියේ යල් කන්නයේදී උඳු වැපිරීමටය. යල් කන්නයේදී කෙරුණු තලහේන් ගොවිතැනටද සුදුසු පස වශයෙන් යොදා ගන්නේ පෙර සඳහන් කල අබ හා කුරහන්වලට මාස් කන්නයේදී යෝග්‍යව පැවති බිම් කොටස්ය.

කිනම් අන්දමේ හේනක් වගා කිරීම සඳහා වුවද කැලය එලි පෙහෙලි කිරීම අවිචාරවත් ලෙස කර නොමැත. කැලෑ එළි පෙහෙලි කිරීමේදී අනුගමනය කර ඇත්තේ කැළෑවලට නැතිනම් වනාන්තරවලට අවම හානි ඇති කල ක්‍රම සහ විධිය.

කැලය කැපීම අවධි තුනකින් සමන්විත වූවකි. හේන් ගොවියාගේ අතක මාපොට ඇඟිල්ලක් හෝ ඊට කුඩා තරමේ මුල්වල නැතිනම් යටිවගා පැල, මුවෙකුගේ කුර අඩි ස්වරූපයට සිටින සේ දෙපෙත්තට බිම් මට්ටමේදීම මිට දිග කැත්තකින් කැපීම හේන් බිමක් ශුද්ධ කිරීමේ මුල්ම කාර්යයි. ඉනික්බිතිව, හේන් ගොවියාගේ අත් දණ්ඩක ප්‍රමාණයේ වටරවුම් හෝ ඊට කුඩා වටරවුම් සහිත නාඹුළු ගස් ඔහුගේ "ඇහේ මට්ටමට" ඉහළින් සිටින සේ කපා දැමීම හේනක් සඳහා කැළය කැපීමේ දෙවන අදියරයි. මේ ක්‍රියාව හැඳින්වූයේ "උත් දඬුවාව කැපීම" යනුවෙනි. අවසාන අදියර වූයේ හේන් බිමෙහි මෙතෙක් ඉතිරි කර තිබූ ගස්වල ඉහළට නැග කුඩා ප්‍රමාණයේ කඳන් කපා හෙළීමය. නැතහොත් ගස් කඳුබෑමය. මෙහිදී අවම වශයෙන් "මුදුන් දල්ල" සහිත ශාඛාව වත් නොකපා ඉතිරි කරන ලදී. පොළවේ වපුරන බෝගවලට ආහාර පිළියෙල කර ගැනීමට සූර්ය රශ්මිය බෙහෙවින්ම අවශ්‍ය නිසා මෙසේ ගස් කඳු බෑ අතරම ගස්වල ඉදිරි වර්ධනය සම්පූර්ණයෙන්ම අහිමි නොකරනු වස් ගසක අත්තක් හෝ දෙකක් ඉතිරි කිරීම, ගසත් මිනිසාත් අතර, කෙරුන කෙතරම් තුලනාත්මක ගනුදෙනුවක්ද? බල්ලට ලයිට් කණුවක් පෙනෙන්නට බැරිවා සේ  තමන් ඉදිරියේ ඇති සෑම ගසක්ම දැත් ඔසවා පොරෝ පහර හෙලමින් මුලින්ම කපා දැමීමේ කැක්කුමක් හෝ ක්‍රෝධයක් එදා හේන් ගොවියා සතුව නොපැවතිණ. මෙහිදී වඩාත් වැදගත් වනුයේ පැළෑටි වර්ධනයට හිරු එළිය මෙන්ම හිරු රශ්මිය ඉතාමත්ම අත්‍යවශ්‍ය බැව් හේන් ගොවියා පාරම්පරිකව දැන සිටි බැවිය.

කැලය ශුද්ධ කිරීමේදී අනුගමනය කළ දෙවැනි සහ තෙවැනි අදියරවල් ගස්වල පුනරාවර්ධනය වේගවත් කරවීම සඳහා ඥාණාන්විතව යොදා ගත් උපක්‍රමයන්ය. කැපූ "අත් දඬුවාව" මිනිසාගේ ඇස් මට්ටමින් ඉහළට ඉතා වේගයෙන් අතු රිකිල්ලා වැවිණ. කඳු බෑ ගස් අතු ද වේගයෙන් ලියලා වැඩිණ. එබැවින් අවුරුදු තුනක් හතරක් පමණ කෙටි කාලයකදී වරක් ගිනි තබා ශුද්ධ කොට ගත් හේන් බිමක ගස්වැල්වල පුනරාවර්ධනය ඇති විය"

## හේන්බිම් සෝදා පාළුව අවම කිරීමේ පාරම්පරික දැනුම

හේන් බිමක් සකසා ගැනීම සඳහා කැලය කපා ගිනි තැබීමෙන් පසු භෂ්මාවශේෂ අතර කුඩා ලී කැබලි හා ඇතැම් විට නොදැවී ගිය කෙටි අතු රිකිලිද වෙත්. මේවා හේන් භාෂාවේදී හැඳින්වූයේ කඩමුලක් වශයෙනි.

හේන් ගිනි තැබීමේදී මතුපිට පොළවේ පසද අඟලක් දෙකක්වත් පිළිස්සී බුරුල්ව පවතී. කඩා හැලෙන නිකිණිපාළු වැස්ස හේතු කොට ගෙන, හේන් බිමක මතුපිට පස නග්නව තිබුණහොත් පාංශු ඛාදනය අතිශයින්ම අන්තරාදායී විය හැක්කේ පස මෙන්ම පසෙහි ඓන්ද්‍රීය සහ සරු කොටස් සෝදා පාළුවට ලක්විය හැකි බැවිනි. මේ පිළිබඳව පාරම්පරිකව ලත් ඥානයෙන් ඇති ගොවියා මෙය වළක්වා ගන්නේ කෙසේද? ඔහු ඉහතින් සඳහන් කළ කඩමුලක් එකතු කොට, හේන හරහා දිය පාරවල් ගලා යා හැකි තැන් හඳුනාගෙන, ඒවා අවහිර වන අයුරින් කඩමුලත් වැටි සකසා තබයි. මේ අනුසාරයෙන් වැසිත් සමග බිහිවන තාවකාලික පුංචි දියපාරවලට හේනක් හරහා නිදැල්ලේ ගලා යා නොහැකිය. කඩමුලත්වැටි ඒ ගලායෑම් අඩාල කොට සෝදා පාළුව අවම කර දමයි. මේ අනුව සලකා බලන විට පෙනී යන්නේ කැළයක් සම්පූර්ණයෙන්ම නොනසා එහි පුනරාවර්ධනයත්, පාංශු සංරක්ෂණයත් පිළිබඳ ඉතා තර්කානුකූලව පිළිගත හැකි විද්‍යානුකූලව ඔප්පු කොට පෙන්විය හැකි පාරම්පරික දැනුමක් ගොවියාට තිබුණු බවය.

## ජල සංරක්ෂණය සඳහා කැලෑවල වැදගත්කම  පිළිබඳ පාරම්පරික ඥානය

වියළි කලාපීය වැසියාගේ ජීව රුධිරය වැසි ජලයයි. සිරුරක ක්‍රියාකාරී පැවැත්මට රුධිරය අවශ්‍ය වන්නා සේ ම වියළි කලාපයේ ජන ජීවිතයටත් සියලු සත්වයින්ගේ අඛණ්ඩ පැවැත්මටත් නිරන්තරව අවශ්‍ය ජලය ලබා දීමේදී එය පිරිසිදුවට එක් රැස් කර තබා ගැනීමේදීත් වනාන්තරවලින් (කැලෑවලින්) වක්‍රව මෙන්ම එක එල්ලේම ඉටුවන සේවය ගැන මෙරට පැවතියේ සුවිශේෂී පාරම්පරික ඥානයකි. මෙරට වාරි ශිෂ්ටාචාරයක් බිහිවීමට මුල් වී ඇත්තේ මෙම පාරම්පරික ඥානයයි. ඒ පාරම්පරික ඥානය පෙරදැරි කරගත් සුවිශේෂී වාරි තාක්ෂණයක් ද මෙහි පැවති බවට අදත් ශේෂව පවතින එල්ලාංග මත පදනම් වූ වැව් අමුණ සාක්ෂි දරයි.

වනාන්තරය පිළිබඳ පාරම්පරික දැනුමේ මුල්ම පියවර වූයේ රාජ්‍ය අනුග්‍රහය සහිතව වූ වන සංරක්ෂණ කාර්යයන්ය. පෙර සිංහල රජ දවස වනයත් සිවුපා සතුනුත් රාජ ආඥා යටතේ රැකගෙන සිටි බවට ඇති ඓතිහාසික සාධක බොහෝය. වන සතුන් ගැබ් ගන්නා කාලයේත් පැටවුන් මෝරන කාලයේත් සතුන් දඩයම් කිරීම සලකා ඇත්තේ රාජ අපරාධයක් ලෙසටයි. දඩයම් කිරීමට උචිත කාලය තීරණය කලේ රජු විසින්ය. ඒ බොහෝ අවස්ථාවලදී රජු විසින් දඩකෙලියේ ගොස් දඩයමට කැලය විවෘත කිරීමෙන් පසුය. මිහිඳු මහරහතන් වහන්සේගේත්, දෙවනපෑතිස් නරපතින්ගේත් අම්බස්ථල හමුව සිදුවූයේ මෙවන් දඩකෙලි ආරම්භක අවස්ථාවකදී නොවිය හැකිද? දෙවනපෑතිස් රජු විසින් ඇරඹූ බවට සාධක ඇති මෙම සම්ප්‍රදායය විසිවන සියවසේ මැද භාගය වන තෙක්ම දිය පිපාසය සංසිඳුවා ගැනීමට දිය කඩිතිවලට එන සිව්පාවුන් දඩයම් කිරීම සඳහා ඒ ආශ්‍රිතව අටවා ගත් කැටවලවල්වල  රැක සිටින දඩයක්කරුවන්ට ගැබ් ගෙන ඇති සිව්පාවෙකුට වෙඩි තැබීම අකපැව පැවතිණ.

වනාන්තර සීමිත  බවත් රැක ගැනීමට මෙන්ම වන සතුන්ගේ පිපාසය සංසිඳුවා ගැනීම සඳහාත් මිනිසා පාරම්පරිකවම අවබෝධ කරගෙන සිටි සහ ක්‍රියාවට නැංවූ තවත් කාර්යයක් නම් කැලෑවල ජලය එක්රැස් කෙරෙන "ගොඩවලවල්" ඉදිකිරීමය. මේවා පුංචි වැව්වලට සමානය. එහෙත් ඒවා ගොවිතැන්වලට ජලය සැපයූ ඒවා නොව කැලයේත් වන සත්වයින්ගේත් ප්‍රයෝජනය සඳහා ඉදිකෙරුණු ඒවාය. උල්පත්වල පැවැත්මට කැළෑ බෙහෙවින්ම ප්‍රයෝජනවත් බැව් පැරැන්නෝ දැන සිටියෝය. එසේම වැසි වැසීමෙන් පසු භූගත වන ජලය පොළවට ආසන්නව තබා

ගැනීමේදී ගස් කොළන්වල වැදගත්කම ද ඔවුහු දන සිටියෝය.

අවට පරිසරය සිසිල්ව තබා ගැනීම සඳහාත් වියළි කාලවලදී අතිශයින්ම පරිසරයේ සිසිල් ගති සුනු විසුනු කරන වියළි හුළංවල නිදල්ලේ හමායෑම අවම කර දැමීම සඳහා (කෘත්‍රිම හෝ ස්වභාවික) කැලය බෙහෙවින්ම වැදගත් බැව් දන සිටි පැරැන්නෝ කෘත්‍රිම සුළං වැටි පවා වැව්වෝය.

කැලය කපා පස නග්න කොට නොසැලකිලි අන්දමින් හේන් ගොවිතැන් කළහොත් එවැනි බිම් සෝදාපාළුවීමත් සමගම ගලා යන ජලයත් සමග එක් වී හෝ මුසු වී එන රොන් මඩ ජලාශවල ගොඩනැගීමත් ඒ ජලාශ අපහැදිලි බොරදියෙන් සමන්විත වීමේ ආදීනවත් පාරම්පරික ඥානය සතුව පැවතියෙන් හේන් ගොවිතැනට වුවත් කැලය යොදා ගැනීම කර ඇත්තේ ඉතා සුපරීක්ෂාකාරීවය.

නැව්වලට බොරදිය ඒම වැළැක්වීමටත්, වැව් ජලය වාෂ්පවීම අඩු කිරීම සඳහාත් ගස් වැවීමේ කලාව සහ එහි ප්‍රයෝජන දන සිටි අතරම එක් රැස් වී ඇති අපිරිසිදු වතුර පිරිසිදු කිරීමටත් ඒ වතුර සිසිල්ව තබා ගැනීමටත් වැවිය යුතු උචිත ගස් පිළිබඳව අතිශය සංකීර්ණ දැනුමක් පැවති බැව් අපට එළිදරව් වන්නේ වැව් බැඳි රාජ්‍යයෙන්ය.

වැවක ඉස්මත්තේ අර්ධ කවාකාර තාවුළු ඉස්මත්තේ ගස් ගොම්මන් වැවීම වැව් ජලය පිරිසිදුව සිසිල්ව තබා ගැනීමටත් මහෝපකාරී වූ ඒවාය. මෙහිදී වැවීමට තෝරාගෙන ඇත්තේ තරමක් පළල් පත්‍ර ඇති එනිසාම සිසිල් සෙවන ගෙනදෙන, පුළුල්, අතු පතර වැවුනු තුරු හිස ඇති, ජලය පිරිසිදු කිරීමේ මෙන්ම සිසිල් කිරීමේ හැකියා ඇති කුඹුක්, නඹඩ, මීදෙල්ල, තිඹිරි, හැළඹ ආදී ගස් වර්ගයෝය. ගස් ගොම්මන මෙවන් ගස්වලින් සමන්විත කරන අතර, වැවක වෑ කන්දට පහළින් එහෙත් ඊට තදාසන්නව පිහිටි කට්ටකාඩු වැවේ හෝ ස්වභාවික වැඩීමට ඉඩ සැලැස්සුවේ හෝ ජලයේ කිවුල්බල උරා ගන්නා ගස් වර්ගයෝය. වැව් බැම්මෙන් කාන්දු වන ලවණ සහිත ජලයේ ලවණ කොටස් මෙහි වැවෙන ගස්වලට උරා ගන්නා හෙයින් වැව පහළ කුඹුරුවල යැවෙන කාන්දු ජලයේ ලවණතාවය අඩුවන හෙයින් ජල සම්පාදිත බෝගවලට යැවෙන ජලයේ හානිය අවම කෙරේ

## ගස්කොළන්වල වෙනස්වීම් ඇසුරෙන් කාලගුණ නිගමනය කිරීමේ පාරම්පරික ඥානය

කැලයේ සමහර ගස් කොළන්වල ඇතිවන අසාමාන්‍ය වෙනස්කම් ආශ්‍රයෙන් අනාවැකි කීම පැරැන්නන් අතර අදත් ඉදහිටවත් කෙරෙන්නකි. තළමල පිපීම බිහිසුණු නියං වියසනයක පෙර නිමිත්තක් සේ සැලකේ. කටුකැළිය, එරමිණියා සහ දිවුල් එලදාව වැඩිවීම ඉදිරියේදී නියගයක මග සලකුණුය. දඹ සහ මෝර එලදාව වැඩි නම් ඉදිරියේදී අධික වර්ෂාපතනයක් බලාපොරොත්තු විය හැක. "දඹ හැලෙන" වැස්ස සහ "මොරසුරන වැස්ස" යන නම් ජනප්‍රවාදයේ පැවතෙන්නේ මේ නිසාය. එසේම අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල මොර එලදාව බහුල වීම ඊළඟ ඔක්තෝම්බර් මාසයේදී එන ඊසාන දිග මෝසම් වැසි ප්‍රමාද වීම හෝ අඩුවීමේ අසුබ ලකුණක් සේ සැලකෙන්නකි. අගෝස්තු මස අවසානයේදී හෝ සැප්තැම්බර් මාසයේ මුලදී මී ගස්වල මල් පිපීම බහුල වුවහොත් ඊළඟ මාස කිහිපය තුළදී වැසි අධිකව ලැබිය හැකි බැව් පැරණි ගම්මුන්ගේ විශ්වාසය වූයේය. නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී ලැබෙන අධික වර්ෂාව මී පැගෙන වැස්ස වශයෙන් හැඳින්වේ. වර්ෂාවේ අධිකකම නිසාම මී ගෙඩි කැඩී එම ගස් යටට යන්නවුවන්ට බහුලවම පැගෙන සේ වැතිරීම එම තදවැසි මෙසේ හැඳින්වීමට හේතු වී තිබේ. මෙසේ තොරතෝංචියක් නොමැති වෘක්ෂලතාදියේ වෙනස්කම් (මල් පිපීම, මල් නොපිපීම, ගෙඩි එල ගැනීම), ගෙඩි එල නොගැනීම, පත්‍රවල පැහැය වෙනස්වීම, පොතුවල ස්වරූපයන් වෙනස්වීම ආදිය) ඉදිරි කාලගුණ විපර්යාසයන් කල්තියා දැන ගැනීමේ හෝඩුවාවල් වශයෙන් සැලකේ.

එසේම ගස්කොලන් ආශ්‍රිතව ජීවත්වන පක්සින්ගේ හා කෘමීන්ගේ ක්‍රියාකාරකම්වල ඇතිවන වෙනස්කම්ද ඉදිරි කාලගුණ අනාවැකි වශයෙන් සැලකේ. හේන් වගාව සඳහා කැලය කපන්නවුන්ට හුඹස්වල බැඳ ඇති මී වද හමුවුවහොත් එය ඉදිරි කන්නයේ වර්ෂාව අඩුවීමේ පෙර සලකුණක් සේ සලකා ඒ කන්නය තුළ වැඩි වශයෙන්ම වියළි කාලගුණය දරා සිටිය හැකි තණසාල් සහ කුරක්කන් වැඩියෙන් හේන්වල වපුරනු ඇත. ර්සාන දිගින් හමන සුළඟින් ආරක්ෂා විය හැකි ගස් බිල වල බැඳ ඇති මී හමුවන්නේ නම් එය ඉදිරියේදී වැඩි වර්ෂාපතනයක් ලැබීමේ පෙර නිමිත්තක් සේ සලකා කුරක්කන් හේන්වල අබ සහ බඩඉරිඟු වැඩි වශයෙන් වගා කිරීමට හේන් ගොවියන් පෙළඹෙයි. හවස් කාලයේ බිම් කළුවර වැටෙන ගොම්මන් වේලාවේදී කැලයේ උල ලේන්නු (පක්ෂි වර්ගයකි) කෑ ගසන්නේ නම් එයද සැලකෙන්නේ මෝසම් වැසි ප්‍රමාද වී ලැබීමක් වශයෙනි'

මේ කරුණු සියල්ල සලකා බලන විට පෙනී යන්නේ, මීට අවුරුදු දස දහසකට එපිටදී අප්‍රිකාවේ වනාන්තර ආශ්‍රිතව වානරයාගේ සිට පරිණාම වූ මානවයාගේ සිට විකාශනය වී වැඩී බෝ වී ඇති මිනිස් සංහතිය විසින් එදා සිට අද දක්වා වනාශ්‍රිතව පාරම්පරිකව උගත් සමහර ක්‍රියාකාරකම්, ඇතුළත් ඥාන සම්භාරයක් තවමත් මුළුමනින්ම විනාශ නොවී පවතින බැව්ය'

ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන්